(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(6).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා

## 2012 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3), 14 සහ 20 වැනි වගන්ති යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 ජූනි 27 දිනැති අංක 1764/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.08.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දිවි නැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2012 සැප්තැම්බර් මස 18 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0657/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු, එක් එක් ව්‍යාපාරයෙහි වෙළඳපල කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1364/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මඩල - දම්මුල්ල - කරදින ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් තුනක පමණ දුර ප්‍රමාණයක් කාපට් අතුරා සංවර්ධනය කර ඇති බවත්;

(ii) එම සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියෙන් තොරව සිදු කර ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කිලෝමීටර් 3 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර අදාළ කාර්මික නිලධාරී වාර්තාව ලබා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් සංවර්ධන කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1724/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් (Industrial Finance Limited) යන නමින් බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලියාපදිංචිකර තිබේද;

(ii) එය ලියාපදිංචිකළ දිනය කවරේද;

(iii) එහි සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් හා මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ පළපුරුද්ද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම සමාගම මීට පෙර වෙනත් සමාගමකට අයිතිව තිබුණේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම කවරේද;

(iii) එහි සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) I.F.L සමාගමේ දැනට සිටින ගනුදෙනුකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි මුදල් තැන්පත්කළ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2011 මාර්තු 31 වැනි දිනට එම සමාගම සතුව තිබූ තැන්පතුවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2503/'12

ගරු තලතා අතුකෝරල මහත්මිය,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී රජයේ ලියාපදිංචිවී සිටි ජනමාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

(ii) එම කාලය තුළදී අතුරුදන් වූ සහ ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය වන විට ලියාපදිංචි කර ඇති පුවත්පත්, ගුවන්විදුලි සේවාවන්, රූපවාහිනී නාලිකා සහ වෙබ් අඩවි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා තහනම් කරන ලද මාධ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් මාධ්‍ය ආයතනය තහනම් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2624/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂයේදී ඉන්ධන මිල ඉහළ ගිය අවස්ථාවේදී,

(i) ජනතාවට භූමිතෙල් සහ ඩීසල් සහනාධාර ලබා දුන්නේද;

(ii) එසේ නම්, එක් පවුලක් සඳහා ලබා දුන් භූමිතෙල් සහනාධාරයේ වටිනාකම කොපමණද;

(iii) භූමිතෙල් සහනාධාර ලබාදීමට ප්‍රතිලාභීන් තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(iv) එම භූමිතෙල් සහනාධාරය ලබාදීමට 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඩීසල් සහනාධාරය ලබා දුන්නේ කා සඳහාද;

(vi) ධීවර ජනතාවටද ඩීසල් සහනාධාර ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී තිබුනේද;

(vii) එසේ නම්, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී ධීවර ජනතාවට ඩීසල් සහනාධාරය ලබාදීමට වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිදි ඩීසල් හා භූමිතෙල් සහනාධාර ලබා දී නොමැති නම්, 2007 සිට මේ දක්වා ජනතාව රවටා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2720/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් එක් පළාතේ ඇති ප්‍රධාන හා අතුරු ජලනල මගින් සිදුවන නාස්තිය සහ අපතේ යාම නිසා වාර්ෂිකව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අහිමි වන ජල ප්‍රමාණය ගැන ගණනය කිරීමක් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඉහත පරිදි එක් එක් පළාතේ වාර්ෂිකව අහිමිවන නල ජල ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් ජල නාස්තිය අවම කර ගැනීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ගැනීමට අපේක්ෂිත පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2776/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින්, බණ්ඩාරගම නිව්ඩාව ප්‍රදේශයේ යන්ත්‍රානුසාරයෙන් ආහාර වියලා පැකට් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) එම ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා ආයෝජනය කර ඇති මුදල කොපමණද;

(iii) එමගින් මේ වන විට ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට මේ දක්වා උපයා ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1841/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණුකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොත්මිටියනදී කොලමුණු ඔය හරහා පාලමක් ඉදිකිරීමට මුල්ගල් තබා වර්ෂයකට අධික කාලයක් ගත වී ඇතත් මෙතෙක් එහි ඉදිකිරීම් ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) (i) කොලමුණු ඔය හරහා ඉදිකිරීමට මුල් ගල් තැබූ පාලමේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2131/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිසියම් තැනැත්තෙකු විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වාහන රැගෙන ගොස් තිබේද;

(ii) එසේ නම්, එම තැනැත්තා කවුරුන්ද;

(iii) ඔහු රැගෙන ගොස් ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) එම වාහනවල වර්ග සහ ලියාපදිංචි අංක කවරේද;

(v) එම වාහන රැගෙන ගිය දිනය කවරේද;

(vi) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එම වාහන ආපසු ලබා දුන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ වාහන ඉහත පරිදි රැගෙන යාම 2004.01.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනි බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වාහන රැගෙන යාම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2185/'11

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමට අදාළව පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) උපයෝජිත සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා දරන ලද පිරිවැය සහ එක් සේවකයකුගෙන් ඉපැයූ ලාභය කොපමණද;

(iv) එක් මගියකු වෙනුවෙන් දැරූ පිරිවැය කොපමණද;

(v) රජය වෙත ගෙවනු ලැබූ තීරුබදු හෝ අනෙකුත් බදු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලබාදී ඇති ප්‍රාග්ධනය, මුදල්, ණය සහ ඇපකර කවරේද;

(ii) ඒවා පිළිබඳ විස්තර කවරේද;

(iii) ඒවා ලබාදී ඇත්තේ කවර කාර්යයන් සඳහාද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) සීමාසහිත ගුවන්තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් මෙතෙක් ගෙවා නොමැති සමස්ත ණය ප්‍රමාණය කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2626/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990 ඔක්තෝබර් 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 හි විධිවිධාන 1996 ජුනි 7 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහජන බැංකු සේවකයින් සඳහා අදාළ කරගන්නා බවත්;

(ii) ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව තම සේවකයින් සඳහා එම චක්‍රලේඛය අදාළ කරගෙන නොමැති බවත්;

(iii) රාජ්‍ය සේවයේ විශේෂ අවශ්‍යතාවක් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90, 1996 දෙසැම්බර් 23 දින අවලංගු කළ බවත්;

(iv) එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 පදනම් කරගෙන මහජන බැංකුව ක්‍රියාත්මක කළ විශ්‍රාම වැටුප් ක්‍රමය මේ දක්වා එම බැංකුව විසින් පවත්වාගෙන යන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 අවලංගු කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි 1996 ජූනි 7 දිනට පෙර තිබූ විශ්‍රාම වැටුප් ක්‍රමය මහජන බැංකු කාර්ය මණ්ඩලය සඳහා නැවත ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2779/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට ශ්‍රී ලංකාව තුළ ගුවන් විදුලි සේවාවන් පවත්වාගෙන යාම සඳහා,

(i) ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාදී ඇති තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ලබා දී ඇති එක් එක් බලපත්‍රය වෙනුවෙන් උක්ත නම් සඳහන් බලපත්‍රලාභීන්ගෙන් අය කරගෙන ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1842/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පිහිටි, යාල විලේජ් හෝටලයට මායිම්ව ඇති යාල අභය භූමියට අයත් විශාල භූමි ප්‍රදේශයක් තුළ සංචාරක කලාපයක් ඇති කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා යොදා ගැනීමට අපේක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම සංචාරක කලාපය සඳහා පවරා ගන්නා ඉඩම් දේශීය හෝ විදේශීය ආයෝජකයින් සඳහා බදු දීමේ සැලසුමක් තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් බදු දෙනු ලබන කාල සීමාව කොපමණද;

(v) විදේශීය ආයෝජකයින් සඳහා ඉඩම් බදු දෙනු ලබන්නේ නම්, එම ආයෝජකයින්ගේ නම් හා ඔවුන් අයත් රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යාල අභය භූමිය අයත් මෙම ප්‍රදේශයේ අක්කරයක් බදු දීමට අපේක්ෂිත මුදල කොපමණද;

(ii) එම ඉඩම් බදුදීම තුළින් රජයේ අපේක්ෂිත ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත පරිදි යාල අභය භූමිය සංචාරක කලාපයක් බවට පත් කිරීම එහි වන සතුන්ට හා වෘක්ෂලතාවලට දැඩි තර්ජනයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි පියවරක් ගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2132/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා ගෙවනු ලබන දීමනාවන් වැඩිකර තිබේද;

(ii) එසේ නම්, වැඩි කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ගෙවන ලද දීමනා ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබාගෙන තිබේද;

(v) එසේ නම්, එම අනුමතිය සභාගත කරන්නේද;

(vi) එකී දීමනාවන් ගෙවීම සඳහා ඉදිරිපත් කළ චක්‍රලේඛය සභාගත කරන්නේද;

(vii) එකී ගෙවීම් සඳහා අනුමතිය ලබා දුන් බලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2186/'11

ගරු රවි කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) විධිමත් කරන ලද වැවිලි සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් සමාගම ඉපැයූ ලාභය හෝ ලැබූ පාඩුව සහ සියලුම සමාගම් එක්ව ගත් කළ ලැබූ ලාභය හෝ පාඩුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) එකී සමාගම්වලට රජය විසින් යම් මුදලක් හෝ ණය මුදලක් ලබාදීම හෝ එම සමාගම් වෙතින් අයවිය යුතුව තිබූ යම් මුදලක් කපා හැරීම සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් පරිදි ලබා දෙන ලද මුදල කොපමණද;

(iii) රජය විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ඉඩම් අත්පත් කරගනිමින් සිටින්නේද;

(iv) එසේ නම්, එලෙස අත්පත් කරගත් ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් අත්පත් කරගනු ලබන්නේ කවර කාර්යයක් සඳහාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රජය විසින් වහාම ක්‍රියාත්මකවන පරිදි නැවත වරක් වැවිලි සමාගම් විධිමත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 සැප්තැම්බර් මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1133/'11

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවා සපයනු ලබන සමස්ත විදුලි පරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයෙන් සේවය ලබා ගන්නා පාරිභෝගිකයන් අතරින් ගෘහස්ථ, රජයේ ආයතන, කාර්මික ආයතන, ආගමික ආයතන සහ වෙනත් යන කාණ්ඩවලට අයත්වන පාරිභෝගික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පාරිභෝගික කාණ්ඩයේ විදුලි පරිභෝජනය සමස්ත නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා වූ පසුගිය වර්ෂ තුනක කාලය තුළ ඉහත (අ)(ii) හි සඳහන් පාරිභෝගික කාණ්ඩවලින් අයකරන ලද විදුලිය සඳහා වූ ගාස්තු ප්‍රමාණයන් කවරේද;

(ii) ඉහත සඳහන් කාල සීමාව තුළ ගාස්තු ප්‍රමාණයන්හි වෙනස්කම් ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 ජනවාරි මස සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මසකට ලැබූ පාඩුව කොපමණද;

(ii) ඉහත සඳහන් විදුලි පාරිභෝගික කාණ්ඩ එකිනෙක මගින් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ පාඩුවට දායක වී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස හා තථ්‍ය වටිනාකම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1370/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, වැලිගම, කප්පරතොට, “දර්ශන” හි පදිංචි එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් වැලිගම, කප්පරතොට, නව ගාලු පාරේ අංක 153/1 දරන තනිගහවත්ත නමැති ඉඩමේ පර්චස් 18.235 පමණ ප්‍රමාණයක් වැලිගම නගර සභාව මගින් පවරා ගෙන ඇති බවත්;

(ii) එම පවරාගැනීම සිදුකොට වර්ෂයකට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ දක්වා වන්දි මුදලක් ගෙවා නොමැති බවත්;

(iii) ගැසට් නිවේදනයක් මගින් පවරා ගන්නා ලද ඉහත ඉඩමට අමතරව එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් ඒ අවට ඉඩම් ද හසුවන සේ වැලිගම නගර සභාව මේ වනවිට ගොඩනැගිලි ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පවරාගත් ඉඩම වෙනුවෙන් මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද ;

(ii) වන්දි මුදල ගෙවන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

(iii) වන්දි ලෙස ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (iii) හි සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදාගත් ඉඩම් කොටස් සඳහා ද වන්දි මුදලක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1868/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සේවය කරන ස්ථිර සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ටෙලිකොම් ආයතනයේ දිවයින පුරා ඇති ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මාසිකව ලබන වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතනයේ අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරීන් මාසිකව ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/’11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපලේ සිදුකරන ලද සියලුම ලැයිස්තුගත කොටස් මිලදීගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කාර ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2106/’11

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ වතුකරයේ දැනට ක්‍රියාත්මක වන,

(i) රජයේ පාසල් සංඛ්‍යාව ඉගැන්වීම් කෙරෙන මාධ්‍ය අනුව, දිස්ත්‍රික් පදනමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ජාතික පාසල්, පළාත් සභා පාසල්, නවෝදයා පාසල් සහ ඉසුරු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්‍රාථමික හා ද්විතීයික පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ද්විතීයික පාසල් 1000 ව්‍යාපෘතියට අයත් වන පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 ක කාලය තුළ වතුකරයේ සිසුන්ගේ 5 වසර, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ප්‍රතිඵල දිස්ත්‍රික් මට්ටමින් හෝ කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වතුකරයේ ළමුන්ට ඉහළ ප්‍රතිඵල ලබාගත හැකි තත්ත්වයක් උදාකිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2288/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමාගම, පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කළ බලයලත් නිලධාරියා කවුරුන්ද;

(iii) එම ඉඩමේ මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ප්‍රථම පදිංචිකරුවන් සිටියේද;

(iv) 1/7 බී, පිටිපන උතුර, හෝමාගම ලිපිනයෙහි වර්ෂ 35ක සිට පදිංචිව සිටින එම්. ඒ. අනුර මහතාගේ ඉඩමද ඉහත කටයුත්ත සඳහා පවරාගෙන තිබේද;

(v) එම ඉඩම් පවරා ගැනීමේදී පදිංචිකරුවන්ට ලබාදුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවරාගෙන ඇති ඉහත ඉඩමේ පදිංචිකරුවන්ගේ විදුලිය මේ වනවිට විසන්ධිකර ඇති බවත්;

(ii) ඔවුන් විසින් පාවිච්චි කරමින් සිටි ළිඳ වසා දමා ඇති බවත්;

(iii) එම ඉඩම් පවරා ගැනීමෙන් පසුව මතුව ඇති ඉහත තත්ත්වයන් නිසා එහි පදිංචිව සිටි පුද්ගලයන්ගේ ජීවත්වීමේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2294/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2000, 2001, 2002, 2003 සහ 2011 යන වර්ෂයන්හිදී වසා දමන ලද මධ්‍යම රජයේ සහ පළාත් සභා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යම් පාසලක් වසා දැමීමේදී,

(i) එම පාසලේ සිසුන් සහ ගුරුවරුන් සම්බන්ධයෙන් ගන්නා විකල්ප ක්‍රියමාර්ගය කවරේද;

(ii) සැලකිල්ලට ගන්නා වූ නිර්ණායකයන් කවරේද;

(iii) එම සැලකිල්ලට ගන්නාවූ නිර්ණායකයන් මේ වන විට වසා දමා ඇති පාසල් සම්බන්ධයෙන් අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 වර්ෂය වන විට වසා දමා ඇති පාසල්වල ගොඩනැගිලි කිසියම් ඵලදායි කාර්යයක් සඳහා මේ වන විට යොදවා තිබේද;

(ii) එසේ නම්, යොදවා ඇති එම කාර්යයන්ගේ ස්වභාවයන් සහ එමගින් උපයන වාර්ෂික ආදායම කවරේද;

(iii) ඵලදායී කාර්යයක යොදවා නොමැති පාසල් ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2785/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියෝග රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන විසින් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ ගැටලුවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 17/2005 මගින් ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණ කවරේද;

(ii) මේ වන විට එම අරමුණ ඉටුවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2005.10.05 දින සිට මේ දක්වා ආරවුල් විභාග කිරීමෙන් පසු ලබාදී ඇති නියෝග සංඛ්‍යාව කොපමණද;

(ii) එම නියෝගයන් අතරින් අදාළ රජයේ ආයතන සහ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කර ඇති නියෝග සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් දෙන ලද නියෝග ප්‍රකාරව කටයුතු සිදුවන්නේ ද යන්න පිළිබඳව පසු විපරමක් සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1843/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල, කණ්ඩලම ප්‍රදේශයේ වටිනා වී ගබඩා ගොඩනැගිලි සංකීර්ණයක් ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා ඇති බවත්;

(ii) රජයේ වී මිලදී ගැනීමේ ක්‍රියාදාමයට ගබඩා පහසුකම් නොමැතිකම බාධාවක් වන බැවින් ගොවීන්ගෙන් මිලදී ගනු ලබන වී තොග ගබඩා කිරීමට ඉහත ගබඩා සංකීර්ණය ප්‍රතිසංස්කරණය කර ප්‍රයෝජනයට ගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ගබඩා සංකීර්ණය ප්‍රතිසංස්කරණය කර වී ගබඩා කිරීමට යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(ii) නොඑසේ නම්, එය වෙනත් ඵලදායි කටයුත්තකට යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, එම කටයුත්ත කවරේද;

(iv) වී ගබඩා කිරීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා එම ගොඩනැගිලි භාවිතා කරන්නේ නම්, එම කටයතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2133/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් වියදම් කළ මුදල සපයා ගත් ආකාරය කවරේද;

(ii) එකී වියදම් සිදු කළ අයිතමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තරඟාවලියේ සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා සිදු කළ වියදම් හේතුවෙන් මෙරටට ප්‍රතිලාභයක් ලැබුනේද;

(ii) එසේ නම්, එම ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා කටයුතු කළ කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් සාමජිකයාගේ නම, තනතුර සහ ඒ සඳහා ඇති සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2187/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට අක්‍රීයව පවතින රාජ්‍ය ව්‍යවසායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යවසායන්හි නම් කවරේද;

(iii) එකී ආයතනයන්හි දැනට සේවයේ නියුතු සමස්ත සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මේ වන විට ලබා ඇති සමස්ත අලාභය කොපමණද;

(v) එකී ආයතනයන්හි පවතින ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අක්‍රීයව පවතින රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමට හෝ වසාදැමීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ අවස්ථාවේදී එම ආයතන සඳහා යළි ප්‍රාග්ධනය සැපයීමක් සිදු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2295/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මානව සහ භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ව්‍යාපෘතියෙහි,

(i) මුඛ්‍ය අරමුණ;

(ii) ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය;

(iii) ඇස්තමේන්තුගත මුළු මුදල;

(iv) විදේශීය ආධාර ලැබෙන්නේ නම්, ඒවා ලබා දෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(v) රජය වෙන්කළ මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1876/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල පළාත් මහ රෝහලේ සායන අංක 72 සහ 73 පවත්වාගෙන යනු ලබන දෙමහල් ගොඩනැගිල්ලේ අත්තිවාරම ගිලා බැසීම නිසා එම ගොඩනැගිල්ලට හානි සිදුවෙමින් පවතින බවත්;

(ii) මෙම ගොඩනැගිල්ල ප්‍රමිතියෙන් තොරව ඉදිකර ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයින් හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම ඉදිකිරීම ලබාදුන් කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදුල්ල පළාත් මහ රෝහල ඉදිකිරීම සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර අදාළ කාර්මික නිලධාරී වාර්තාව ලබා ගෙන තිබේද;

(iii) එම රෝහලේ ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2134/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 අයවැය යෝජනා යටතේ පාඩු ලබන ඇඟලුම් කර්මාන්ත නගා සිටුවීම සඳහා රජය වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබාදුන් ඇඟලුම් කර්මාන්තශාලාවල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් කර්මාන්තශාලාව සඳහා ලබා දුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඇඟලුම් කර්මාන්තශාලා සඳහා මුදල් ලබා දුන් මූල්‍ය ආයතන කවරේද;

(v) එම එක් එක් මූල්‍ය ආයතනය විසින් ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මුදල් ලබාගත් ඇඟලුම් කර්මාන්තශාලා විසින් මේ වන විට ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) මේ වන විට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(viii) එම මුදල් ලබා ගැනීමෙන් පසු එක් එක් කර්මාන්තශාලාව විසින් උත්පාදනය කර ඇති රැකියා අවස්ථා ගණන කොපමණද;

(ix) එම කර්මාන්තශාලා අතරින් මේ වන විට ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2188/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ,

(i) රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව මෙහෙයවන ලද දේශීය බහාලූ ප්‍රමාණය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ පහ තුළ සිදුවෙතැයි අපේක්‍ෂා කරන බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහක කාලය තුළ,

(i) ශ්‍රී ලංකාවේ වරායවල මෙහෙයවන ලද නැව් භාණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ මෙහෙයුම් වියදම සහ උපයාගත් ආදායමේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

(iii) වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද සාමාන්‍ය නැව් භාණ්ඩ ප්‍රමාණය එක් එක් වරාය සහ නැංගුරම් පොළ අනුව කොපමණද;

(iv) එම භාණ්ඩ අතරින් බහුතර භාණ්ඩ ප්‍රමාණයක ආරම්භක නැව්ගත කළ ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 සැප්තැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1197/'11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත බිත්තර පරිභෝජනය සහ ඒක පුද්ගල බිත්තර පරිභෝජනය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

(v) බිත්තර ආනයනකරුවන් වෙත ලබාදුන් තථ්‍ය සහනාධාරය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන බිත්තරවලට සහ දේශීයව නිෂ්පාදනය කරනු ලබන බිත්තරවලට පනවා ඇති සියලු ඍජු හා වක්‍ර බදු කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1396/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලතොට ප්‍රදේශයේ පිහිටා ඇති දංගහ ඇළ පාලම ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් දැඩි අනතුරුදායක තත්ත්වයක් ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) මේ වන විට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2036/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විදේශගතවීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය විසින් වාර්ෂිකව වියදම් කර ඇති මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී, නිලධාරීන් විදේශගත වූ එක් එක් අවස්ථාවේදී වියදම් කළ මුදල;

(iii) එම එක් එක් අවස්ථාවේදී නිලධාරීන් විදේශගත වී සිටි දින ගණන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලධාරීන්ගේ ඉහත සඳහන් විදේශගතවීම් හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ යහපත් හෝ අයහපත් ප්‍රතිඵල කවරේද;

(ii) විදේශගත වූ නිලධාරීන්ගේ ගමන් වියදම්, නවාතැන් ගත් ස්ථාන සඳහා කළ වියදම් සහ අනෙකුත් වියදම් එක් එක් නිලධාරියාට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිලධාරීන්ගේ සංචාර විස්තර සටහන් පත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී නිලධාරීන්ගේ මාසික වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2296/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඉසුරු පාසල් හා නවෝදා පාසල් ව්‍යාපෘති,

(i) ආරම්භ කළ වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ආරම්භ කිරීමේ පරමාර්ථයන් කවරේද;

(iii) මේ වන විටත් එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉසුරු පාසල් හා නවෝදයා පාසල් ව්‍යාපෘති සඳහා,

(i) යොදවා ඇති දේශීය අරමුදල් ප්‍රමාණය;

(ii) යොදවා ඇති විදේශ අරමුදල් ප්‍රමාණය;

(iii) විදේශ අරමුදල් ලබා දී ඇති ආයතන, ලබා දුන් මුදල සහ වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත ව්‍යාපෘති යටතේ,

(i) ආරම්භ කළ වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කළ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(ii) ඉදිරි වර්ෂ දහය තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂිත ඉසුරු හා නවෝදයා පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විතියික පාසල් දහසේ ව්‍යාපෘතියට ඇතුළත්වන ඉසුරු හා නවෝදයා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1877/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නානගොඩ පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, නානගොඩ පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2135/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පුළුල් කරන ලද කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ දෙපස ආරක්ෂක වැටෙහි එක් මීටරයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ආරක්ෂක වැටෙහි මීටරයක් ඉදිකිරීම සඳහා වියදම් වූ මුදල කොපමණද;

(iii) ඇස්තමේන්තුවේ සඳහන් ආරක්ෂක වැටේ සමස්ත දුර ප්‍රමාණය කොපමණද;

(iv) ආරක්ෂක වැට වෙනුවෙන් ඇස්තමේන්තුගත සමස්ත මුදල කොපමණද;

(v) එම ආරක්ෂක වැට ඉදිකිරීම සඳහා වියදම් වූ සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇස්තමේන්තුවේ සඳහන් දුර ප්‍රමාණයට අමතරව ආරක්ෂක වැටෙහි දීර්ඝ කිරීම් සිදු කර තිබේද?

(ii) එසේ නම්, එම දුර ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2189/'11

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1970 - 1977 කාලයේ පැවති රජය යටතේ පාසිකුඩා හි ඛනිජ තෙල් ඇති බව සොයා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඛනිජ තෙල් සොයා ගනු ලැබූ දිනය කවරේද;

(iii) සොයා ගත් ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සොයා ගත් බව වර්තමාන ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, සොයා ගනු ලැබූ ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය දේශීය වෙළඳපලට විකුණනු ලබන දිනය කවරේද;

(iv) තෙල් සහ ගෑස් මිල අඩු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2298/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ සිදුකරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා එම එක් එක් ප්‍රතිසංස්කරණය ගෙන ඒම සඳහා මුඛ්‍ය වූ අරමුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උක්ත එක් එක් ප්‍රතිසංස්කරණය යටතේ පාසල් විෂය නිර්දේශ සම්බන්ධයෙන් සිදුකර ඇති සංශෝධනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1878/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල අධ්‍යාපන කලාපයේ, හාල්පන්දෙණිය රත්න විද්‍යාලය වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම පාසලේ සම්පත් යොදා ගෙන රජයේ කර්මාන්ත ශාලාවක් හෝ වෙනත් කටයුත්තක් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iii) එම සැලසුම් අනුව පාසලේ ආරම්භ කිරීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2136/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග ඉදිකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම මේ වන විට ඈවර කර තිබේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ ඉන්වොයිස් කරන ලද කුලී ගාස්තු වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වත්කම් කුලියට දීමට අදාළව සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගම හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර ගිවිසුම් අත්සන්කර තිබේද;

(iv) එම ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ ආයෝජනය කර ඇති අරමුදල් සඳහා කොටස් සහතික තිබේද;

(ii) එම සහතික සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2190/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 10ක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ පවත්වන ලද මැතිවරණ සංඛ්‍යාව කොපමණද;

(ii) සියලු පළාත් සභා එක් දිනයකදී පවත්වනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, එම මැතිවරණ එකවර නොපැවැත්වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 ජනවාරි 01 වැනිදා සිට මේ දක්වා කාලය තුළ පවත්වන ලද එක් එක් මැතිවරණය සඳහා දරන ලද සමස්ත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඊළඟ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත දිනය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිතා නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2299/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා වතුකරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මකකර ඇති වැඩසටහන් කවරේද;

(ii) එම එක් එක් වැඩසටහන සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වතුකරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් මෑතකාලයේදී කටයුතු කර ඇති විවිධ රාජ්‍ය නොවන ආයතන කවරේද;

(ii) ඒ ඒ ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් හා ඒවා සඳහා යොදවා ඇති මූල්‍යමය වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1200/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා ගිය රටවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී රැකියා සඳහා මෙම රටවලට ගිය ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් උපයාගත් සාමාන්‍ය වැටුප කොපමණද;

(iv) ඔවුන්ට ලැබෙන වැටුපෙහි අවම වැටුප් මට්ටමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1579/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර ප්‍රධාන තැපැල් කාර්යාලයේ පිහිටි නිලධාරීන්ගේ නේවාසිකාගාරය දැඩිසේ අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2037/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝල තාප විදුලි බලාගාරය සඳහා ගල්අඟුරු සැපයීමේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති සමාගමේ නම කුමක්ද;

(ii) එම කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ගල්අඟුරු සපයනු ලබන ඉහත සමාගම වෙත ලබා දී තිබේද;

(ii) එම ඇගයීම් සහතිකය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගල්අඟුරු සැපයීමේ ගිවිසුම ආරම්භවන දිනය සහ බලපවත්නා කාල සීමාව කවරේද;

(ii) එම ගිවිසුම ආරම්භක අවස්ථාවේ සිට 2011 ඔක්තෝබර් මාසය දක්වා සපයා ඇති ගල්අඟුරු මෙට්‍රික් ටොන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී කාලසීමාව සඳහා සත්‍ය වශයෙන් අවශ්‍ය වූ ගල්අඟුරු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1879/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හබුරුගල, හොරවල රෝහල මගින් ග්‍රාම නිලධාරී වසම් 18ක පමණ ජනතාවකට සේවය ලබාදෙන බවත්;

(ii) එම රෝහලට ප්‍රමාණවත් තරම් වෛද්‍යවරු නොමැති බවත්;

(iii) මේ හේතුවෙන්, එම රෝහල මේ වන විට වැසීයාමේ අවදානමකට මුහුණ පා ඇති බවත්;

(iv) එම රෝහලෙහි මීට වර්ෂ 20කට පමණ පෙර ඉදිකිරීම් ආරම්භ කළ ගොඩනැගිල්ල මේ දක්වා අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හබුරුගල, හොරවල රෝහලෙහි පවතින වෛද්‍යවරුන්ගේ සහ ගොඩනැගිලිවල හිඟයට කඩිනමින් විසඳුම් ලබාදෙන්නේද;

(ii) ඒ සඳහා සැලසුම් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2137/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගම වෙත ලබා දී ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලබා දුන් දිනයන් කවරේද;

(iii) ලබා දුන් එම වාහනවල අංක සහ වර්ගයන් කවරේද;

(iv) එම වාහන ලබා දීමට හේතු කවරේද;

(v) මේ වනවිට ආපසු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාගත් වාහන කවරේද;

(vi) ආපසු ලබා ගත් වාහනවල තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහත සමාගම වෙත ලබා දුන් වාහන සඳහා නියමිත පරිදි ගෙවීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එක් එක් වාහනය සඳහා ලබාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2191/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත වගකීම් ප්‍රමාණය එක් එක් වරාය අනුව කවරේද;

(ii) වරාය අධිකාරිය විසින් ඇපවීම් සහ බැංකු ඇප ලබාදුන් හෝ ඔවුන් විසින් ලබා නොගත් ණය සඳහා වගකීම භාරගත් අවස්ථා කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එළඹී ගිවිසුම ඉහත (අ)(i)හි දී ඇති වගකීම් සඳහා ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා වරාය අධිකාරියට අයත් හෝ වරාය අධිකාරිය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරියට අයත් ඉඩම් එම ඉඩම්වල ප්‍රමාණයන්ද සමග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වෙන් කර ඇති ඉඩම්වල සිදුකරමින් තිබෙන ක්‍රියාකාරකම් කවරේද;

(iv) වරාය අධිකාරිය විසින් නඩත්තු කිරීම සඳහා මුදල් වියදම් දරන ඉඩම් හෝ ගොඩනැගිලි සහිත ඉඩම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2011 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ශුද්ධ ලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1880/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල අධ්‍යාපන කලාපයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලයේ පවතින ගොඩනැගිලි හා ගුරු හිඟය නිසා සිසුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බවත්;

(ii) එම විද්‍යාලයේ ගොඩනැගිලි හිඟය සහ ගුරු හිඟය පිළිබඳව බලධාරීන්ට දන්වා සිටියත් මේ දක්වා විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී දුම්රිය දෙපාර්තමේන්තුව ලැබූ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) අද වන විට අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ස්ථිර සේවයට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව සහ අනියම් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පත්වීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ මහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(v) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(vi) ඉහත ආයතනවලින් අනුමතිය නොලබා පත්වීම් සිදු කර තිබේද;

(vii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2192/'11

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරයා විසින් සිදුකරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංචාරය කළ රටවල් කවරේද;

(iii) එම සංචාරයන් සම්බන්ධව දක්වා ඇති අරමුණු සපුරා ගැනීමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයා විසින් කැඳවාගෙන යන ලද නිලධාරීන් සංඛ්‍යාව සහ එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාරයන් සඳහා යොදා ගන්නා ලද අරමුදල් මහජන මුදල්ද, නැතිනම් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ප්‍රදානය කරන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 11/'10

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුළත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/’10

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/’10

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/’10

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/’10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/’10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/’10

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා “තත්ත්ව ආරක්ෂණ සභාවක්” නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/’10

ගරු රවී කරුණානායක මහතා,— “විශේෂ නඩු පවරන නිලධාරී” නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු

ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවි කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවි කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවි කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවි කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවි කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවි කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායි කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදී සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ධ්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපලට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,—අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා

සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින්

හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/’10

ගරු බුද්ධික පතිරණ මහතා, —නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම, — පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/’10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/’10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/’10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමුපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරහ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" ස්ථාපනය කිරීම,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා වන දස අවුරුදු ජාතික සැලැස්මක් ඇති කිරීම ජාතික ඒකාබද්ධතාව සහ සමාජ සංහිඳියාව සඳහා ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් බැවින්, කෙටි කාලීන නිරාවරණ වැඩ සටහන් යටතේ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් හුවමාරුව සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" මගින් බහුතරයක් සිංහල භාෂාව කථා කරන ප්‍රදේශවල තිබෙන එක් එක් පාසල්, දෙමළ මාධ්‍ය පාසල් සමග සම්බන්ධ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවි කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'11

ගරු අජිත් කුමාර මහතා,— පූර්ව ළමා විය අධ්‍යාපනය පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— අප රට තුළ දරුවන්ගේ අධ්‍යාපනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දීම (පෙර පාසල් අධ්‍යාපනය) පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර පෙර පාසල් පාලිකාවන්ට විධිමත් පුහුණුවක් හා බඳවා ගැනීමේ ක්‍රමයක් සමගින් වැටුප් ක්‍රමයක් ද සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

ගරු රවි කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

ගරු රවි කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වානිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවී කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවී කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවී කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.